## පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 492

## පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලය

පාර්ලිමේන්තුවේ රජයේ ගිණුම් කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තා සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 119 ( 4 ) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

## பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம் : 492

## பாராளுமன்றத்தின் அரசாங்கக்கட்சி முதற்கோலாசான் அலுவலகம்

பாராளுமன்றத்தின் அரசாங்கக் கணக்குகள் பற்றிய குழுவினால் முன்வைக்கப்பட்ட அறிக்கை தொடர்பாக நிலையியற் கட்டளை இலக்கம் 119 (4) இன் கீழ் நிறுவனங்களுக்குப் பொறுப்பான கௌரவ அமைச்சரின் அவதானிப்புகளும் அது தொடர்பாக மேற்கொண்ட நடவடிக்கைகளையும் பாராளுமன்றத்திற்குச் சமர்ப்பித்தல்.

## Parliamentary Series No.492

## Office of the Chief Government Whip of Parliament

Submissions of observations of the Hon. Minister in charge of the institutions and steps taken with regard to the reports tabled by the committee on Public Accounts in terms of Standing Order No. 119 ( 4 )

පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලය

Office of the Chief Government Whip of Parliament

பாராளுமன்றத்தின் அரசாங்கக்கட்சி முதற்கோலாசான் அலுவலகம்

**ස්ථාවර නියෝග 119 (4 ) ප්‍රකාර රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද වාර්තා සම්බන්ධ නිරීක්ෂණ හා ගනු ලැබූ පියවර ඉදිරිපත් කිරීම.**

**පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 492**

**ආයතනයේ නම : පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලය**

| කාරක සභාව විසින් හඳුනා ගන්නා ලද අඩුපාඩු | අඩුපාඩු නිවැරදි කිරීම සඳහා ආයතනය විසින් ගන්නා ලද ක්‍රියාමාර්ග / වර්තමාන තත්වය |
|---|---|
| ආයතනය පිළිබඳව මහජනයාට අවශ්‍ය තොරතුරු ලබාදීම සඳහා වෙබ් අඩවියක් නිර්මාණය කර පවත්වා ගෙන ගොස් නොතිබුණි. ආයතනයේ පවත්වා ගෙන යනු ලබන වෙබ් අඩවිය මගින් මහජනයාට පැමිණිලි හෝ ප්‍රශංසා සටහන් කිරීම සඳහා අවස්ථාව සලසා දී නොතිබුණි. | පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලය වෙනම වැය ශීර්ෂයක් යටතේ ක්‍රියාත්මක වුවද මෙම කාර්යාලයේ කටයුතු පාර්ලිමේන්තුව හා ඒකාබද්ධව සිදු කරනු ලැබේ.<br>මෙම කාර්යාලයේ සිදු කරනුයේ පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගේ කටයුතු සම්බන්ධීකරණය කිරීම සහ පාර්ලිමේන්තුවේ කටයුතු සඳහා සහාය වීම වන අතර, එකී සියළුම මන්ත්‍රීවරුන්ගේ තොරතුරු සහ අදාළ අනෙකුත් තොරතුරු ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ වෙබ් අඩවියට ඇතුළත් කර ඇත. එබැවින් වෙනම වෙබ් අඩවියක් පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවයක් මේ දක්වා පැන නැගී නොමැත.<br>වෙනමම වෙබ් අඩවියක් පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය මූල්‍යමය වියදම් හා මානව සම්පත සැළකිල්ලට ගැනීමේදී එය ඵලදායී නොවන බව විගණන හා කළමනාකරණ කමිටු රැස්වීමේදී කරුණු ඉදිරිපත් කරන ලදී. |
| ආයතනය තම විෂය පථය අනුව තිරසර අරමුණු හඳුනාගෙන නොතිබුණි. හඳුනාගත් තිරසර අරමුණු ඉටු කර ගැනීම සඳහා ළඟා කර ගත යුතු ඉලක්ක තීරණය කර නොතිබුණි. හඳුනාගත් තිරසර අරමුණු ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක නියම කර නොතිබුණි. | 2026 වර්ෂය සඳහා තිරසර අරමුණු 03 ක් හඳුනා ගෙන ඇති අතර ඒ සඳහා ළඟා කර ගත යුතු ඉලක්ක සහ ප්‍රගතිය මැන බැලීමේ දර්ශක නියම කර ඇත. |

ජේ.එම්.ජේ.කේ.ජයසුන්දර
ආණ්ඩු පක්ෂ ප්‍රධාන සංවිධායක ලේකම්
2026.05.